# MANRECAP මාසික පුවත් නිවේදනය #19

| ජුලි 2007 සිට අගෝස්තු 2007 | # 19 |
|---|---|

## 1 : ප්‍රජා ක්‍රියාකාරී සැලැසුම නිරීක්ෂණය පිළිබඳව පැවැත්වූ වැඩ මුළුව

මන්නාරම් දිසා ලේකම් පාලන ප්‍රදේශය තුල වූ පුත්තුකමාම් ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි ගම්මාන තුනක් වූ වඩුපත්තන්මාඩු තෙවාඩි මුරුදන්කුලම් සහ සම්යපුරම් යන ගම්මාන සඳහා වූ ප්‍රජා ක්‍රියාකාරී සැලසුම කාරණය සඳහා වූ වැඩ මුලුව 2007 අගොස්තු මාසයේ 11 වන දින පුත්තුකමාම් වලදී පවත්වන ලදී. මේ නිරීක්ෂණ වැඩ මුලුවේ ප්‍රධාන කර්තව්‍යය වූයේ මැන්රිකැප් ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලද පසුගිය වැඩ සැලසුම ගැන නිරීක්ෂණය කිරීමටත් හැම ගමක් වෙනුවෙන්ම පසුගිය වැඩ සටහන්වලට අනුව ඉදිරි සංවර්ධන සැලසුම් සකස් කිරීමටත් ය. CBO වල නියෝජිතයින් සහ කුඩා කණ්ඩායම් වල නියාමකවරුන් ද මේ වැඩ මුලුවට සහභාගී වී ඉදිරි වැඩ සැලසුම් ගැන බොහොම ගුණාත්මක සාකච්ජාවක් පවත්වන ලදී. මේ වැඩ මුලුව අවසානයේදී කෘෂි කර්මාන්තය සහ අනෙකුත් ආදායම් උපයන මාර්ග සහිතව ඔවුන්ගේ ක්‍රියාකාරී සැලැස්ම සහ ඒවාට සහයෝගය දක්වන අනෙකුත් සංවිධාන ද පෙන්නුම් කරමින් ඉදිරිපත් කරන ලදී. වසර තුනක කාලයක් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමෙන් පසු ප්‍රදේශයේ ජනතාව දැඩි ආත්ම විශ්වාසයකින් කටයුතු කරන අතර තව දුරටත් මැන්රිකැප් ව්‍යාපෘතිය මත යැපීමට අවශ්‍ය නොවන ප්‍රකාශ කරන ලදී. මෙයට ප්‍රධානතම හේතුව වන්නේ මැන්රිකැප් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ ආකාරයේ සාර්ථකත්වය බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.





## 2 : ශාන්ති පුරම් ප්‍රජා ජලසම්පාදන ක්‍රමයේ ඉදිකිරීම් කටයුතු

ක්‍රමානුකූල ජල සම්පාදන ක්‍රමයක් ඇතිකර ගැනීම ශාන්තිපුරම් ජනතාවගේ දීර්ඝ කාලයක් නිසිසේ තිබුණු දැඩි අපේක්ෂාවකි. හේතුව දැනට ගමේ ජීවත්වන පවුල් තුන්සියකකට පමණ ඇත්තේ පොදු ජල නල හතරක් පමණයි. එමෙන්ම මේ ප්‍රදේශයේ ප්‍රධාන සමාජ ගැටළුවක් වී ඇත්තේ ජලය හිඟකමය. පලමුවෙන් මේ ප්‍රජා ජල සම්පාදන ක්‍රමය ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයට ඉදිකිරීමේ කටයුතු පෞද්ගලික සමාගමකට පවරා දීමට අපේක්ෂා කරන ලදී. ජල සම්පාදන මණ්ඩලය ඒ වෙනුවෙන් පෞද්ගලික අංශයෙන් මිල ගණන් ද කැඳවන ලදී. එහෙත් ප්‍රදේශයේ පැවැති අයහපත් ආරක්ෂක තත්වය හේතුවෙන් ඉදිරිපත් කල මිල ගණන් ඉතාම අධික වීම නිසා ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම මුලු මනින්ම ඇනහිටින ලදී. මේ බාධකය මග හරවා ගැනීමට මන්නාරම හිටපු මහ දිසාපති තුමා මෙවැනි යෝජනාවක් කරන ලදී. ජාතික ජල සම්පාදන මණ්ඩලය සහ මැන්රිකැප් ව්‍යාපෘතිය එකතුව ප්‍රජා සහයෝගීතාවයෙන් මේ ඉදිකිරීම් කටයුතු කරගෙන යෑමට යෝජනා විය. මේ අනුව සියලුම පාර්ශවවල සාකච්ජා වට කිහිපයකින් පසුව ශාන්තිපුරම් ජනතාවගේ සහභාගීත්වය ඇතිව මේ ඉදිකිරීම් වැඩ කටයුතු ආරම්භ කිරීමට තීරණය විය. එහෙයින් පසුගිය අගෝස්තු 9 වන දින ග්‍රාමසංවර්ධන සමිතියේත් කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියත් එක් වී ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී.

මේ වැඩ කටයුතු වලට වෘත්තිකයින්ගේ තාක්ෂණ හා ශිල්පීය දැනුම අවශ්‍ය වූ නිසා ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයේ නිරීක්ෂකවරුන් දිනපතාම ඉදිකිරීම් කටයුතු සිදුවන ස්ථාන වලට පැමිණ වැඩවල ප්‍රගතියත් ඒ කායුයන්ට අවශ්‍ය වන්නා වූ ශිල්පීය උපදෙස් ද CBO ට ලබා දෙයි.

ශාන්ති පුරම් ජනතාවට දීර්ඝ කාලීන බලා පොරොත්තුවක් වූයේ නිසියාකාර ජලසම්පාදන ක්‍රමයක් ලබාගැනීමටය. ඒ සඳහා ඉතාම උනන්දුවෙන් මහන්සි වී වැඩ කොට වර්ෂා කාලයට මත්තෙන් එය නිම කිරීම ඔවුන්ගේ බලාපොරොත්තුවයි.


වර්තමාන තත්වය ශාන්තිපුරම් වල ඇති පොදු ජල නලයන්


ඉදිකිරීම් වැඩපලේ ජනතාව වැඩෙහි යෙදී සිටින අයුරු



ඉදකිරීම් වැඩ පලක්


ඉදිකිරීම් වැඩපලක ජනතාව වැඩ කරන ආකාරය

## 3 : ගනේෂපුරම් වල ප්‍රජා ජල සම්පාදන ක්‍රමයක ඉදිකිරීම් කටයුතු



මාන්තායි බටහිර උපදිසාපති කොට්ඨාශය තුල (අනාරක්ෂිත ප්‍රදේශයේ) සියලුම පුනරුත්ථාපන ඉදිකිරීම් කටයුතු ප්‍රදේශයේ ආරක්ෂක තත්වය වඩාත් අයහපත් තත්වයට පත් වූ නිසා සියලුම ස්වේච්ඡා ආධාර සංවිධාන වලට අතරමග නතර කර දැමීමට සිදුවිය. එහෙයින් විශේෂයෙන්ම අනාරක්ෂිත ප්‍රදේශයට ඇතුලුවීමේ සහ පිටවීමේ ස්ථාන වසා දැමුණු නිසා සිමෙන්ති වැනි ගොඩනැගිලි ද්‍රව්‍ය වල බරපතල හිඟයක් ඇත.

අනාරක්ෂිත ප්‍රදේශයේ ආරක්ෂක තත්වය පිරිහීමට පත් වුවත් ගැමි ප්‍රජාවගේ සහයෝගිය මත ඉදිකිරීම් කටයුතු තරමක් දුරට හෝ පවත්වා ගෙන යෑමට මැන්රිකැප් ව්‍යාපෘතියට හැකිවී තිබේ.

ගනේෂ්පුරම් වල ප්‍රජා ජලසම්පාදන ක්‍රමයේ ඉදිකිරීම මෙයට හොඳ උදාහරණයකි. ඉදිකිරීම් වලට සම්බන්ධ ජනතාව කාණු හාරා ජලනල වැලලීමට පටන් ගෙන ඇත. එහෙත් සිමෙන්ති වල දැඩි හිඟයක් පවතින නිසා වැඩ නිමකිරීමට එය ප්‍රධාන බාධාවක් වී ඇත. මේ අනාරක්ෂිත ප්‍රදේශයට සිමෙන්ති ප්‍රවාහනය කර ගැනීම සඳහා ගනේෂ්පුරම් ජනතාව සහ මැන්රිකොප් ව්‍යාපෘතිය බොහොම බලාපොරොත්තුවෙන් සිටී. හැකි ඉක්මනින්ම අවශ්‍ය ප්‍රමාණයට සිමෙන්ති සපයා ගැනීමට හැකිවේ යැයි යන බලාපොරොත්තුවෙන් ප්‍රජා සාමාජිකයින් බොහොම උනන්දුවෙන් ඉදිකිරීම් කාර්යයයේ යෙදී සිටී.

ඡායාරූපය: ඉදිකිරීම් වැඩපලේ ජනතාව වැඩෙහි යෙදී සිටින අයුරු.

## 4 : වවුනියා විශ්ව විද්‍යාල මණ්ඩලයෙහි ඩිප්ලෝමා පාඨමාලාවක් ඇරඹූ වගයි.



පසුගිය අගෝස්තු මස 4 වන දින යාපනය සරසවියේ වවුනියා මණ්ඩපයෙහි දෙමල භාෂාවෙන් සහයෝගීතා ප්‍රජා සංවර්ධනය ගැන ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කරන ලදී. මැන්රිකැප් ව්‍යාපෘතිය එහි මූලිකත්වය ගෙන ක්‍රියා කල අතර එයට සරසවියේ ද සහයෝගය ලැබුනි. මේ ඩිප්ලෝමා පාඨමාලාවේ ඉලක්කය වූයේ ගම් මට්ටමේ සිටින රජයේ සේවකයින් ද ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති සේවකයින් ද විශේෂයෙන්ම උතුරු පලාතේ සේවය කරන රාජ්‍ය නොවන සංවිධාන වල සේවකයින් ද ඉලක්ක කර ගෙනය.

පසුගිය අගෝස්තු 12 වැනි දින ව්‍යාපෘතිය සම්බන්ධ කටයුතු කරන කෙටි කාලීන විශේෂඥයෙකු වූ මහාචාර්ය හොසාකා මහ පාඨමාලාව ගැන දේශනයක් පවත්වන ලදී. එයට සහභාගී වූ සියලු දෙනාම ඒ දේශනය ගැන ඉතාම ඕනෑකමින් සවන් දුන්හ. හේතුව මේ වාගේ දේශනයකට සවන් දිමට සහභාගීත්ව අවස්ථාවක් ලැබෙන්නේ ඉතා කලාතුරකින් නිසායි.

අනාගතයේදී මේ විශ්ව විද්‍යාලය තුල උතුරු ප්‍රදේශයේ ප්‍රජා සංවර්ධන ක්‍රියා වලින් අතර මානව සම්පත් සංවර්ධනය ගැන තැනක් ලබාදීමටත් මානව සම්පත් අංශය තුල ජාල කේන්ද්‍රයක් ඇති කිරීමටත් බලාපොරොත්තු වෙයි.

ඡායාරූපය: වවුනියා සරසවි මණ්ඩපය තුල මහාචාර්ය හොසාකාගේ දේශනය පැවැත්වීම.